අධ්‍යාපන අමාත්‍යාංශය

6 වන බඳවා ගැනීම සඳහා අයදුම්පත් කැඳවීම

පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය

IFSLS

අධ්‍යාපන අමාත්‍යාංශයේ ශිෂ්‍ය ණය අංශය මගින් අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් ශ්‍රී ලාංකික ශිෂ්‍යයින් උදෙසා පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරනු ලබයි.

අධ්‍යාපන අමාත්‍යාංශය මගින් පිළිගත් රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන මගින් මෙහෙයවනු ලබන තෝරාගත් උපාධි පාඨමාලා හැදෑරීම සඳහා මෙමගින් අවස්ථාව සලසනු ලබයි.

2018/2019/2020 වර්ෂයන්හි අ.පො.ස. (උසස් පෙළ) විභාගය සමත් සිසුන්
6 වන බඳවා ගැනීම සඳහා සුදුසුකම් සපුරාලයි

උපාධි වැඩසටහන්

සියලුම උපාධි වැඩසටහන් ඉංග්‍රීසි මාධ්‍යයෙන් මෙහෙයවනු ලබන අතර, උපාධි වැඩසටහන් 111ක් ඇත. www.studentloans.mohe.gov.lk වෙබ් අඩවියෙහි ඇති ශිෂ්‍ය මාර්ගෝපදේශ පොත මගින් එම ලැයිස්තුවට යොමු විය හැකිය.

අයදුම් කළ යුතු අන්දම

සුදුසුකම්ලත් අපේක්ෂකයින් www.studentloans.mohe.gov.lk මගින් මාර්ගගත අයදුම්පත් ඉදිරිපත් කිරීමේ පද්ධතිය භාවිත කළ යුතුය.

අයදුම්පත් ඉදිරිපත් කිරීමේ කාලය

ආරම්භක දිනය	:	2021. 12. 21
අවසාන දිනය	:	2022. 01. 31

ඇතුළත් වීම සඳහා අවම සුදුසුකම්

i. අ.පො.ස. (උ.පෙළ) විභාගයට අනුමත විෂයන් තුනක් සඳහා අවම වශයෙන් තෙවරකට නොවැඩි වාර ගණනකදී සාමාන්‍ය සාමාර්ථ (S) ලබා ගැනීම; සහ

ii. අ.පො.ස. (උ.පෙළ) විභාගයේදී සාමාන්‍ය පොදු පරීක්ෂණයට සඳහා උපරිම වාර තුනක් යන නොහේද්සියට යටත්ව අවම වශයෙන් ලකුණු 30 ක් ලබා තිබීම.

iii. (අ) අ.පො.ස. (උසස් පෙළ) සාමාන්‍ය ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථයක් හෝ අ.පො.ස. (සාමාන්‍ය පෙළ) ඉංග්‍රීසි විෂයයට සාමාන්‍ය (S) සාමාර්ථයක් ලබා තිබීම හෝ

(ආ) ශිෂ්‍ය මාර්ගෝපදේශ පොතෙහි සඳහන් සියලුම අදාළ පාඨමාලාවක ඉංග්‍රීසි හා සන්නිවේදන නිපුණතා විෂයය සඳහා සාමාර්ථයක් ලබා තිබීම.

iv. අයදුම්කරුවන්ගේ වයස 2022 ජනවාරි 31 දිනට අවුරුදු 25 හෝ ඊට අඩුවිය යුතුය.

වෙනත් සුදුසුකම්

උපාධි වැඩසටහන් සඳහා ඇතුළත් වීමේ අනෙකුත් අධ්‍යාපන සුදුසුකම් දැන ගැනීමට www.studentloans.mohe.gov.lk හි මාර්ගෝපදේශ පොත පරිශීලනය කරන්න.

තෝරාගැනීමේ නිර්ණායකයන්

අදාළ පාඨමාලා සඳහා බඳවා ගැනීම පහත සඳහන් කරුණු මත පදනම් වේ.

i. අයදුම්කරු විසින් සපුරාලිය යුතු අවම සුදුසුකම්

ii. උපාධි පාඨමාලා සඳහා අයදුම්කරුවන් විසින් සඳහන්කර ඇති ප්‍රමුඛතා අනුපිළිවෙළ

iii. අදාළ රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන විසින් එක් එක් උපාධි වැඩසටහන් සඳහා ප්‍රදානය කොට ඇති ආසන සංඛ්‍යාව.

iv. ලැබී ඇති අයදුම්පත් සංඛ්‍යාව අදාළ ආයතනයේ එක් එක් උපාධි වැඩසටහන සඳහා වන ආසන ධාරිතාව ඉක්මවා යනවිටදී අයදුම්කරුවන් අ.පො.ස. (උ/පෙළ) විභාගයේදී ලබාගන්නා Z අගය.

උපරිම ණය ප්‍රමාණයන්

ණය වර්ගය	වසර 3 උපාධි වැඩසටහන්	වසර 4 උපාධි වැඩසටහන්
පාඨමාලා ගාස්තු*	රු. 600,000	රු. 800,000
දීමනාව**	රු. 225,000	රු. 300,000

* අදාළ සඳහන් ණය මුදලින් සම්පූර්ණ පාඨමාලාව හැදෑරිය හැකිය.

** දීමනාව ණය මුදල එක් කාර්තුවකට රු. 18,750/- ක් (මසකට රු. 6,250/-) බැගින් සිසුවෙකුට ගෙවනු ලැබේ.

ණය ලබාගත හැක්කේ කෙසේද?

අධ්‍යාපන අමාත්‍යාංශය විසින් තෝරාගනු ලැබූ සිසුන් ණය ලබාදීමට සුදුසු බවට ලංකා බැංකුව වෙත නිර්දේශ කරන අතර, සිසුන් තම අයදුම්පත් ඇපකරුවන් දෙදෙනෙක් (දෙමව්පියන්ගෙන් අයෙක් සහ ළඟම ඥාතියකු) සමග ඉදිරිපත් කළ යුතුය.

ශිෂ්‍යයින්ගේ ප්‍රගතිය සලකා බලා අධ්‍යාපන අමාත්‍යාංශය විසින් නිර්දේශ කරන පරිදි සෘජුවම පාඨමාලා ගාස්තු ගෙවනු ලැබේ.

ශිෂ්‍ය වගකීම

පොලී රහිත ශිෂ්‍ය ණය යෝජනා ක්‍රමය යටතේ පහසුකම් ලබන සියලුම සිසුන් උපාධි වැඩසටහනෙහි සෑම අනිවාර්යය විෂයක් සඳහාම අවම 'C' සාමාර්ථයක් කාලසීමාව ලබාගත යුතු අතර, ඔවුන්ගේ අධ්‍යයන කාලසීමාව තුළ පැමිණීම අවමවශයෙන් 80% ක් පවත්වා ගත යුතුය.

ආපසු ගෙවිය යුතු අන්දම

සම්පූර්ණ ණය කාල සීමාව වසර 12 කි.

අධ්‍යයන කාල සීමාව හා එක් වසරක සහන කාලයකට පසුව ණය මුදල ආපසු ගෙවීම ආරම්භ කළ යුතුය.

උපාධි වැඩසටහනේ කාල සීමාව	සහන කාලය	ආපසු ගෙවීම ආරම්භය සහ වාරික ගණන
වසර 3	වසර 1	වසර 4 කට පසු වසර 8 ක් තුළ සමාන වාරික 96 කින්
වසර 4	වසර 1	වසර 5 කට පසු. වසර 7 ක් තුළ සමාන වාරික 84 කින්.

IFSLS සඳහා අයදුම් කළ හැකි රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන ආයතන

SLIIT, Green University Town, CINEC Campus, SIBA Campus, CA Sri Lanka, KIU, SLTC, ESOFT Metro Campus, ICBT Campus, BCI Campus, RIC, BMS, IIHS

වැඩි විස්තර සඳහා අමතන්න

ශිෂ්‍ය ණය අංශය
රාජ්‍ය නොවන උසස් අධ්‍යාපන අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය
අංක 980/4A, වික්‍රමසිංහ පෙදෙස,
බත්තරමුල්ල

ඊමේල්: dsis@mohe.gov.lk
වෙබ්: www.mohe.gov.lk
දුරකථන: 070 355 970 - 979
ෆැක්ස්: 0112 879 719

tamilguru.lk